දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

මගේ අංකය )
எனது இல ) CF/EXP/11/2024
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2024.06.18
Date )

**පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 - 101 / 2024**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල - කොළඹ

අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර

රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානින්,

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධර ගණය (MN – 4 – 2006 (A) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය – 2024 (දෙවන වාරය)

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති තනතුරු සඳහා II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර සමත් වියයුතු වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය **2024.08.25** දින සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

### 02. සුදුසුකම්

මෙම විභාගයට අයදුම්කල හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති තනතුරක ( **සුභසාධක නිලධාරී, සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී, ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරී, ප්‍රජා සෞඛ්‍ය සමාජ සේවා නිලධාරී** ) II ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති, මේ වනවිට විභාගය සම්පූර්ණ නොකළ නිලධාරීන්ට පමණි.

**සැ.යු. : අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2024.07.10 වනවිට II ශ්‍රේණියට පත්කර, අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන් පමණක් අයදුම්පත්‍ර යොමු කරන්න.**

### 03. අයදුම්පත්

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ (විභාග) වෙත **2024.07.10** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර එම ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවර" **ආශ්‍රිත නිලධර ගණය (MN – 4 – 2006 (A) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය – 2024 (දෙවන වාරය)**" ලෙස සඳහන් කල යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියා විසින් ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා ද විසින් සහතික කර තිබීම අනිවාර්ය වේ.** තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" × 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**04.** විභාග ගාස්තු

I. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

**05.** විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කලයුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාල ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත්කරන ලද හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06.** විභාග පරිපාටිය

මෙම විභාගය **විෂයයබද්ධ කරුණු** සහ **පරිගණක පරීක්ෂණය** යනුවෙන් රචනා මාදිලියේ ප්‍රශ්නවලින් යුත් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතවේ. විෂයයබද්ධ කරුණු ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 07 කින් සමන්විත වන අතර ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. පරිගණක පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය, ප්‍රශ්න 08 කින් සමන්විත වන අතර ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 02 කි. මුළු ලකුණු 100 කි. සමත් වීම සඳහා අවම වශයෙන් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 40ක් ලබාගත යුතුය.

**07.** විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශ | |
|---|---|---|
| | තනතුර | විෂය නිර්දේශය |
| 07:1 විෂයයබද්ධ කරුණු | 1. සුභ සාධක නිලධාරී | රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවක සුභ සාධනය.<br>ඉහත ක්ෂේත්‍රයන් ආවරණය වන සේ සකස් කරනු ලබන ලිඛිත ප්‍රශ්න පත්‍රයකි. |
| | 2. සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී | කැමරාකරණය පිළිබඳ දැනුම සම්බන්ධයෙන් (කාච මගින් ප්‍රතිබිම්භ ගබඩාකර ගැනීම, ඩිජිටල් කැමරා ක්‍රියාකරන ආකාරය පිළිබඳ, ආලෝක පාලන ක්‍රම ආදිය) සකස් කරනු ලබන ලිඛිත ප්‍රශ්න පත්‍රයකි. |
| | 3. ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරී | * ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ (මුද්‍රිත හා විද්‍යුත්) නිපදවීම.<br>* ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාරව සිටීම, ඒවායේ නඩත්තු සහ සේවා කටයුතු.<br>* සෞඛ්‍ය අධ්‍යාපනික වැඩ සටහන්වලට අවශ්‍ය ශ්‍රව්‍ය ආශ්‍රිත උපකරණ නිපදවීම.<br>ඉහත ක්ෂේත්‍රයන් ආවරණය වන සේ සකස් කරනු ලබන ලිඛිත ප්‍රශ්න පත්‍රයකි. |
| | 4. ප්‍රජා සෞඛ්‍ය සමාජ සේවා නිලධාරී | සමාජ විද්‍යාව, ප්‍රජා සංවිධාන, මානව චර්යා, සමාජ කටයුතු, සෞඛ්‍ය සත්කාර ලබාදීම යන ක්ෂේත්‍රයන් ආවරණය වන සේ සකස් කරනු ලබන ලිඛිත ප්‍රශ්න පත්‍රයකි. |

| | | |
|---|---|---|
| 07:2 | පරිගණක පරීක්ෂණය | පහත හැකියාවන් අයදුම්කරුවන් සතුව තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.<br><br>තොරතුරු තාක්ෂණ පිළිබඳ මූලික සංකල්ප<br>(අ) පරිගණකයේ මූලික කොටස් හා ඒවායේ වැදගත්කම<br><br>පද්ධති මෘදුකාංග<br>උදා :-ක්‍රියාකාරී පද්ධති (Operating System)<br>(ආ) දෘඩාංග හා මෘදුකාංග → පද්ධති මෘදුකාංග / → භාවිත මෘදුකාංග<br>භාවිත මෘදුකාංග<br><br>මේ යටතේ බලාපොරොත්තු වන දැනුම හා කුසලතා<br>(අ) පරිගණකයක් ක්‍රමානුකූලව පණගැන්වීම හා ක්‍රියාවිරහිත කිරීම.<br>(ආ) පරිගණක තැටියක පරිගණක ගොනු රාශි (Directory) හා පරිගණක ගොනු (Files) පිහිටි ආකාරය<br>(ඇ) පරිගණක ගොනු රාශි අළුතින් ඇති කිරීම; එම ගොනු රාශියක ගොනුවක් අළුතින් ඇරඹීම; ගොනු කපා දැමීම (Delete); පිටපත් කිරීම (Copy); පිටපත්කල ගොනු වෙනත් ගොනු රාශියක පිටපත් කිරීම; ගොනුවක්, එක් ගොනු රාශියකින් තවත් ගොනු රාශියකට ගෙන යාම (Move), නම වෙනස් කිරීම (Rename)<br>(ඉ) ගොනු රාශියක අඩංගු ගොනු සංඛ්‍යාව ගොනුවක විශාලත්වය, ගොනුවක් විවෘත කිරීමට අවශ්‍ය මෘදුකාංගය, එය ආරම්භ කල හෝ යාවත්කාලීන කල දිනය පිළිබඳ තොරතුරු සොයා ගැනීම.<br>(ඊ) මෘදුකාංගය නැවත සැකසීම (Format) |

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විදුයුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

**09.** කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු සියලුම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN – 4 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති 02 ඡේදයේ සඳහන් තනතුරු වල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

Web Path ; www.health.gov.lk → Staff Assess → Administration → Examination → Circulars

**සැ.යු. : මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

EXP

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

ආදර්ශ අයදුම්පත

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධර ගණය (MN – 4 – 2006 (A) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2024 (දෙවන වාරය)

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම ( සිංහලෙන් ) : ..............................................................

..............................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමග නම ( සිංහලෙන් ) : ..............................................................

..............................................................................................

(iv) මුලකුරු සමග නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ)

i. තනතුර ..............................................................

ii. II ශ්‍රේණියට පත්කළ/ උසස් කල ලිපි අංකය ..............................................

දිනය ..............................................

(II ශ්‍රේණියට පත්කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් මේ සමග අමුණන්න.)

iii. දැනට ලබන වාර්ෂික වැටුප ..............................................................

iv. ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

v. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

vi. විද්‍යුත් ලිපිනය ..............................................................

02 ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න.

විෂයයබද්ධ කරුණු ☐ පරිගණක පරීක්ෂණය ☐

03 (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්)..............................................................

(ඉංග්‍රීසියෙන්) ..............................................

(ආ) එය අයත් දිස්ත්‍රික්කය ..............................................................

(ඇ) එම ආයතනය අයත් වන්නේ - රේඛීය අමාත්‍යාංශයට ☐

- පළාත් සභාවට ☐

(ඈ) පළාත් සභාවේ නම් අදාල පළාත ..............................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4"ප්‍රමාණයේ රු.110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද?............

(ඊ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ..............................................................

..............................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ..............................................

..............................................................................................

04 විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) ..............................................

05 (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද ? ........................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේද ? ......................

| මුද්දර කොටුව |
| --- |
| |

### 06 අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් /ප්‍රථම වතාවට නොවන බැවින් රු...... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්*, මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

..............................................

අයදුම්කරුගේ අත්සන

දිනය ......................

### 07 පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ /නිලධාරිනියගේ සහතිකය

මෙම අයදුම්පත භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්,මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ......................................  ..........................................

නම සහ අත්සන

### 08 ආයතන ප්‍රධානියාගේ සහතිකය

...........................................................................මහතා/මිය/මෙනවිය*...........................................................................නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත්/ ප්‍රථම වතාවට නොවන බවත්*, රු ............. ක් වටිනා මුද්දර මෙම අයදුම් පත්‍රයට අලවා ඇති බවත්/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බවත්* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

දිනය ........................  ...............................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

[ රබර් මුද්‍රාව තැබිය යුතුය]

### 09 විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

...................................................මහතා / මහත්මිය / මෙනවිය*.....................................

නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ..........................  .................................................

විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

( * - අනවශ්‍ය කොටස් කපා හරින්න. )